# මගේ දෙවැනි ආදරේ ඉපදුණු දා



අයන්සා මනුති උදම්යා වික්‍රමරත්න

# මගේ දෙවැනි
# ආදරේ ඉපදුණු දා

# මගේ දෙවෙනි ආදරේ ඉපදුණු දා

අයන්සා මනුති උදම්යා වික්‍රමරත්න

චිත්‍ර : අයන්සා මනුති උදම්යා වික්‍රමරත්න

කෘතියේ අයිතිය : අයන්සා මනුති උදම්යා වික්‍රමරත්න

ප්‍රථම මුද්‍රණය - **2021**

ISBN-978-624-96981-3-0

පරිගණක අකුරු සැකසුම - ජනිත් ප්‍රින්ට් ෂොප් - අඹතැන්න

මුද්‍රණය - ජනිත් ප්‍රින්ට් ෂොප් - අඹතැන්න

**සංශෝධනය 2023**

# පිදුම

මට ජීවිතය දුන් මගේ ආදරණීය අම්මාටත්,
තාත්තාටත්,
කුඩා කලම මා පුංචි කතුවරියක් කළ
මගේ දෙවැනි අම්මා වූ නදීකා සමන්මලී
ආදරණීය ගුරු මෑණියන්ටත්,
දැනට මා ඉගෙනුම ලබන 8-ඒ පන්තියේ
සසිකා කුමාරි ගුරු මෑණියන්ටත්,
" දූලාට පොත් ගොඩක් ලියන්න පුළුවන් "
කියමින් අපව දිරිමත් කළ
සෙනවිරත්න ගුරු පියාණන්ටත්
මගේම ආදරණීය අත්තම්මටත්
මෙම පොත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාවන්ත දැනුමින් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව යි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සහිත ලේඛන අංකුර දහස් ගණනනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි. **2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කර දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමව්පියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තෘතිය මෙමගින් පිරිනමන ලදී.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහමායා බාලිකා විද්‍යාලය
මහනුවර

**2023.11.01**

සැප්තැම්බර් 12 වැනිදා තමයි මගේ දෙවෙනි ආදරෙයි ඉපදුන දවස. ඔයාල දන්නවද? ඒ කවුද කියලා, ඔන්න මං කියන්නම්කෝ 'මගේ චූටි මේ චූටිම චූටි ලේ පැංචි' සමාවෙන්න 'හි හි හි' මට පොඩ්ඩක් විතර වැරදුනා. ඒ තමයි මගේ චූටිම චූටි නංගි. ආ ඔයාලා දන්නවද මගේ පලවෙනි ආදරේ තමයි මගේ ලොකු නංගි....




මම දැන් දෙවෙනි ආදරේ ගැන කියන්න පටන් ගන්නම්. ඔන්න එදා මම ඉස්කෝලේ යන දවසක් ඉතින් හැම ළමයෙක්ම මගින් ගැහුවා 'ඔයාගේ නංගි ඉපදුණාද කියලා' හැබැයි මට හරි උත්තරයක් කියාගන්න බැරි වුණා, මොකද මම හරියටම දැනගෙන හිටියේ නැහැනේ. ඒ හින්දා මම උත්තරේ වෙනුවට දුන්නෙ 'දන්නේ නෑ' කියලා.



ඉස්කෝලේ අවසන් සීනුව වදිනකම් මටනම් ඉවසිල්ලක් නැහැ යාලුවනේ! ඔන්න ඉතින් මම ඉස්කෝලෙ ඇරිලා තාත්තා දකින විට මට හරිම සතුටුයි. මම ඒ වෙලාවෙම තාත්තාගෙන් ඇහුවා, එතකොට මට සුභ ආරංචියක් දැනගන්න ලැබුණා. මොකක්ද දන්නවද ඒ සුබම සුබ ආරංචිය, අපිට චූටිම චූටි නංගි බබෙක් ලැබිලා කියලා.






මම ඒ සුභ ආරංචිය අහල 'යේ' ගගා උඩ පැන්නා. මට ඉවසිල්ලක් නැහැ ඉතින්, ඉක්මනට මූණ කට හෝද ගත්තා. නංගිත් මමත් ලස්සන ගවුම් ඇඳගෙන, හනි හනිකට ඉස්පිරිතාලයේ අම්මා ඉන්න වාට්ටුවට, මමයි නංගියි තාත්තායි ගියා.


චූටිම චූටි ලස්සන නංගි පැටියෙක් අම්මට ආදරයෙන්
තුරුළු වෙලා හිටියා. එයා රෝසම රෝස පාටයි.
මට වඩා ගන්න හිතුනා.

ඔන්න දවස් දෙකකට පස්සේ අම්මයි චූටි නංගි ගෙදර ආවා. චූටි  නංගි අපේ ගෙදර එයාව තියන කාමරය, ලොකු නංගි මමයි ලස්සන මල් අලවලා, බැලුම් එල්ලලා ලස්සනට සැරසුවා. අපිට ගොඩක් සතුටුයි.



අනේ මට හිතන විටත් හරිම පුදුමයි! මම දැන් නංගිලා දෙන්නාගේම ලොකු අක්කා කෙනෙක්. හරිම ෂෝක් ඉතින් මම එයාට හැමතිස්සේම කතා කළේ 'සුදු බෝලේ, මා බෝලේ' කියලා. ඒවා අහලා ගෙදර හැමෝටම හිනා. දවස් කීපයකට පස්සෙ අපි නංගිට නම් තිබ්බා. දන්නවාද එයාගේ නම මොකක්ද කියලා, 'ගෙහන්සා කිතුමි උදිතයා වික්‍රමරත්න.'



මම ඔයාට හුගා.........රියක් ආදරෙයි මගේ නංගී බබෝ, මම ඔයාගේ දඟකාර ලොකු අක්කා!

# වසර 4කට

# පසුව....



මටත් නොදැනීම කාලය බොහෝ ලෙස ගෙවී ගිහින්. හිතාගන්නත් බැහැ, අපේ මේ ලේන් පැංචි මෙච්චර ඉක්මනට ලොකු වුනාද කියලා. පුංචි කාලේ මා දිහා ඇස් ලොකු කරන් බලා හිටිය නංගි, දැන් මට 'ලොකු අක්කි' කියල කෑගහලා කියන තරමටම ලොකු වෙලා. මගේ පුංචි යාලුවනේ! යාලුවනේ, දැන් නිතරම එහා මෙහා දුව පනිමින්, කෑගසමින්, අපිත් සමග සෙල්ලම් කරමින්, තරහ වෙමින්, යාලු වෙමින්, බොරුවට හඬමින් 'අම්මේ මට ලොකු අක්කි ගැහුවා' කියා කෑගසන මගේ චුටි නංගිගෙන් අපේ ගෙදරම සතුටින් පිරිලා ඉතින් මගේ චුටි බට්ටියෝ වෙනද කියුවා වගේම මම ඔයාට හැමදා මත් හුගා.......රියක් ආදරෙයි. මගේ චුටි නංගිට බුදු සරණයි! මම ඔයාගේ ආදරණීය, දඟකාර ලොකු අක්කා හොදේ!!

# යාළුවනේ අපි නැවත හමුවෙමු!

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතික නව මාවතකට යොමු කරමින් පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මේ විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනනගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 .11. 01